

# අඳුන් සිහින 4

හේමමාලා හේරත් ලියන නවකතාව

"මම මොනවද කීවේ ?" ඇස් විවර කළ ඇසිල්ලේම රිදීමා සිය යෙහෙළියන්ගෙන් ප්‍රශ්න කළාය. යෙහෙළියන් තවමත් උන්නේ ගල් ගැසිලාය.

"අමා...." ඈ අමා වෙත හැරුණාය. අමාගේ මුහුණෙහි පළවූ හැඟීම් කිසිවක් ඇයට නොතේරුණේය.

"හ්ම්...." අමා මඳක් කල්පනා කළාය. "රිදීමා.... ඔයා කියපු දේවල් මොනවද කියලා දැනගන්න මේ වෙලාවේ ගොඩක් මහන්සි වෙන්නෙපා. ඔයාගේ මොළේට පොඩි විවේකයක් දෙන්න...."

"මට එහෙම අමාරුවක් නෑ අමා. මට ඕනෑ මම ඔයාලට මොනවද කීවේ කියලා දැනගන්නයි..."
"හොඳයි ඔයාට දැනගන්න ඕනම නම් මම කියන්නම්..."
පසෙක උන් මහීකාට සුසුමක් හෙළුනේය.

"මම ඔයාට කීව විදියට ඔයා, ඔයාගේ අතීතෙට ගියා. හැබැයි මට මෙහෙම දෙයක් තේරුණා රිදීමා... ඔයා අපට විස්තර කළේ, ඒ හැමදෙයක්ම පිට ඉඳන් බලන කෙනෙක් විදියට. ඔයා ඒ එක අවස්ථාවකවත් එතන හිටපු බවක් පෙනුණේ නැහැ..."

"ඒ කීවේ ?" රිදීමා ප්‍රශ්න කළාය.
"හිතන්න ඔයා, ඔයාගේ ගෙදර සාලේ වෙන දේවල් අපට විස්තර කළා. කුස්සියේ වෙන දේවල් විස්තර කළා. ඒත් හරියට හීනයක් දකින කෙනෙක් විදියට. හැඟීම් මුකුත් තිබුණේ නැහැ. එහෙම තිබුණේ ඔයා වතුරේ ගහගෙන යන වෙලාවේ විතරයි. එතනදි නම් වතුරට ගහගෙන ගියේ ඔයාමයි... ඔයා කොච්චර බයවෙලා කෑගැහැව්වද කීවොත් මෙයාලා තාමත් බයවෙලා..."

අමා අනෙක් යෙහෙළියන් දෙස හැරුණාය. "බලන්න තාමත් ගල් පිළිම ටික වගේ ඉන්න ලස්සන...."

රිදීමා යාන්තමට හිනැහුණාය. ඇගේ ඔළුව පැටළුණු නූල් බෝලයක් මෙනි. සිහින රැසකට මැදිවී, ඉන් ගොඩ ආ ගත නොහැකි ලෙසකි, ඇයට දැනුණේ.
"මම කීවනේ දැන් ඔළුවට වද දෙන්න එපා කියලා..." අමා යළිත් පැවසුවාය.

සියල්ලෝම කෑම මේසය වටා රැස් උණෝය. රාත්‍රී ආහාර ගැනීමට තරම් රුචියක් කිසිවෙකු තුළ දක්නට නොලැබිණි. රිදීමා, තමා ළග උන් මහීකා දෙස හැරුණාය.
"මම කීවා ඔයාට, මගේ මූණේ ඉරියව් හොඳින් බලන්න කියලා... බැලුවද ?"

මහීකා අකමැත්තෙන් තම උරහිස් හැකිළුවාය.
"බැලුවා..."
"මට කියන්න ඔයා දැක්කේ මොනවද කියලා ?"
මහීකා කල්පනා කළාය. තොල්පට විකුවාය. අනතුරුව අනෙකුත් යෙහෙළියන් වෙත හැරුණාය.
"අමා ඔයාට ගෙදර ඉන්න කාලෙට යන්න කීවම, පාසල් කාලෙට නිවාඩු කාලවලට යන්න කීවම ඇත්තට ඔයාගේ මූණේ කිසිම හැඟීමක් තිබුණෙ නෑ. දකින දෙයක් විස්තර කරනවා වගේ පෙනුණේ. ඔයාගේ මූණේ දුක, වේදනාව, සතුට වගේ මොනම හැඟීමක් තිබුණේ නැහැ.... හැබැයි අමා කීවා වගේ, ඔයා වතුරට ගහගෙන යනවා නම් අපිත් දැක්කා...."

"ඒක නම් අපිට හොඳටම දැනුණා... හරියට අපිත් එතන හිටියා වගේ" රුචිරා පැවසුවාය.

"මම හිතුවේ ඔයා මේ දැන් ගිලෙයි කියලා...."

"එකේ තේරුම මොක-ක්ද ?"
රිදීමා නැවත අමා දෙසට හැරුණාය.

"මට තාම හිතාගන්න බැහැ රිදීමා.... මට හිතුණේ ඔයා ඒ අවස්ථාවල එතන නොහිටියාද කියලත්.... ඔන්න එක වෙලාවක ඔයා අප්පච්චිට තරහා ගිහින් කීවා. අම්මා දුකෙන් හිටියා කීවා. ඒත් ඔයාට කිසිම ගානක් තිබුණේ නෑ. හරියට ෆිල්ම් එකක් බලනවා වගේ....."
ඈ තම හිස දෙපසට වැනුවාය.

"මට තව ටිකක් හිතන්න ඕනි.... හැබැයි ඔයා....."

අමා, රිදීමා දෙසට ඇඟිල්ලක් උරුක් කළාය.
"කල්පනාවට යන්නේ නැහැ... අදට සද්ද නැතිව නිදාගන්න ඕනි...."

★★★★★★★★★★★★★★★★★★★★★★★★★★

තමාගේ සාමාන්‍ය, එදිනෙදා දිවියට පිවිසීමට රිදීමාට අමාරු වූයේය. කොතෙකුත් මෝහනය වූ අවස්ථාවේ කළ, කී දෑ කල්පනා කිරීම නිසාය. ඇය බොහෝවිට සිටියේ අතීතයේය. තමා මෝහනය කිරීමට එකඟවීම ගැනද ඈ පසුතැවුණාය. මේ නිසා මහීකාගේ හැසිරීම වෙනස් වී ඇති බව ඇය දුටුවේ පමාවීලාය. වෙනදා තොර තෝංචියක් නැතිව කතා කරන මහීකා මේ දිනවල කාලය ගතකළේ මොබයිල් ෆෝනයේ බොත්තම් තද කරමිනි.

"ඔයා මොනවද ඔය කරන්නේ ?" වැඩ කිරීමට අමාරුම තැන ඈ, මහීකගෙන් විමසුවාය. ඔවුන් සිටියේ කෑම කාමරයේ මේසය වටා හිඳගෙනය. රිදීමා තමන්ට අතපසු වූ සටහන් කිහිපයක් කොපි කරමින් උන්නාය. මහීකා නම් වැඩක් කරනා බවක් නොපෙනුණේය.
"MS කරනවා....."

"කාටද ?" මහීකාගේ මුහුණ වෙනස්වනු රිදීමාට පෙනුණේය.
"යාළුවෙකුට...."
"කවුද යාළුවා ? මමත් දන්න කෙනෙක්ද ?"
"නෑ......" මහීකා හිස ගැස්සුවාය.
"මගේ ටියුෂ් ක්ලාස් එකේ ළමයෙක්....."
ඈ තවත් බොත්තම් කිහිපයක් තද කළාය.

"ඉතින් ඔය යාළුවට කෙළින්ම රිං කරන්නකෝ !"
"එයා මේ වෙලාවේ වැඩ...."
"මේ වෙලාවේ ?"
රිදීමාට ඔරලෝසුව දෙස බැලුණේය.
"රෑ නවයට....."

"ඔව් ! " මහීකාගේ හඬ පහත් විය. ඇගේ දෙනෙතේ වූයේ මුරණ්ඩු බවකි. "එයා පාර්ට් ටයිම් වැඩක් කරනවා රෑට...."

"ඕහ් ! " රිදීමාට යමක් සිහියට නැගුණේය.
"ඔයා ඔය කියන්නේ අජය ගැනද ?"
මහීකා නැගිටිටේ 'දඩාස් ' ගා පුටුව පසෙකට තල්ලු කරමිනි.

"මට පිස්සුද අජයට SMS අරින්න...."
"ඒකම තමා මටත් දැනගන්න ඕන උණේ..."
මහීකාගේ මොබයිලය ගීතවත් හඬක් නැගිය. ඈ ඒ දෙස වහා බැලුවාය. ඇගේ මුහුණ සිනහවෙන් ඔප වැටිණි.

"ඒ පාර මොකක්ද ?" රිදීමා ඇසුවාය.
"එයා රිං කරනවා කියලා තියනවා තව ටිකකි-න්"
"කවුද ? ටියුෂ් ක්ලාස් එකේ යාළුවද ?"
"නෑ අජය...." මහීකා කිකිණි හඬ නැගුවාය.
රිදීමා තම හිස දෑතේ රුවා ගත්තාය.

"මේ ළමයා මොනවා කරනවද කියලා මට නම් තේරෙන්නේ නැහැ." ඈ තමාටම කියා ගත්තාය.

රිදීමා හා සතුටින් සිනාවූ මුත්, නාද වූ ටෙලිෆෝනය ගත් මහීකා ඊට පිළිතුරු දුන්නේ අමුතු තාලයකටය.

